**වවමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2016 මාර්තු 30 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණණය කළ මතය

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් වවමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.198,000 ක් සඳහා වූ ගනුදෙනු විගණනයේදී සත්නිරීක්ෂණය කළ නොහැකි විය.

#### 1.3.2 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| පරිච්ඡේදය III - රීති 24 | ප්‍රාදේශීය සභාවේ මාර්ග හා වීථි ලැයිස්තුව රජයේ ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි. |
| පරිච්ඡේදය V - රීති 120 | රු.122,232 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය තුළදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | |
| පරිච්ඡේදය 3 - රීති 33 | බදු හා තක්සේරු ලිපිකරු විසින් ගෙවීම් පැහැර හැර පුද්ගලයින් පිළිබඳ කාර්තු ලැයිස්තු පිළියෙල කර ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ රු.56,275,746 ක් වූ ආදායම සමඟ සැසඳුවිට ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,900,898 ක් විය. කුලී ආදායම සහ ප්‍රදාන වැඩිවීම හේතුකොට ගෙන පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,374,848 කින් වැඩිවී තිබුණි.

### 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, රු.166,884,332 ක් වූ ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය සමඟ සැසඳුවිට සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනය රු.180,432,230 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කාරක ප්‍රාග්ධන රු.13,547,899 කින් වැඩි වී තිබුණි.

### 2.3 ආදායම් කළමනාකරණය

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කරන ලද පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තත්‍ය | රු'000 |
| | රු'000 | රු'000 | |
| වරිපනම් හා බදු | 670 | 141 | 2,138 |
| බදු කුලී | 39,117 | 30,598 | - |
| බලපත්‍ර ගාස්තු | 1,369 | 1,433 | - |
| වෙනත් ආදායම් | 60,000 | 79,847 | 78,655 |
| | 101,165 | 112,019 | 80,793 |

**2.3.2 වරිපනම් හා බදු**

රු.2,138,421 ක් වූ හිඟ වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි.

**2.3.3 මුද්දර ගාස්තු**

වර්ෂ 2011 සිට 2015 දක්වා රු.97,559,923 ක් වූ මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතුව තිබූ නමුත්, අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 උපයෝජනය නොකළ වත්කම්**

වසර ගණනාවක් තිස්සේ සභාවේ පික් අප් රථයක් නිශ්කාර්යව පැවතුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

රු.මිලියන තුනක් වූ ජල සැපයුම් ව්‍යාපෘතිය නිමකර තිබූ නමුත්, ජල සැපයුම් කටයුතු නවතා තිබුණි.

**3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. වගකීම්භාරය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

අවිධිමත් අයවැය පිළියෙල කිරීම නිසා අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.50,052 සිට රු.2,537,829 දක්වා වූ වෙනස්කම් නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන කටයුතු ඵලදායි අන්දමින් මෙහෙයවා නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අයවැය

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) අත්තිකාරම් මුදල්